**සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම -2020**
**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වෙනස් කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී .හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ  පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව තොගය භෞතිකව සත්‍යාපනයකොට පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු වුවත් හුණුපිටිය ගබඩා සංකීර්ණයෙහි ගබඩා කර තිබූ ඇතැම් පොහොර තොග භෞතිකව සත්‍යාපනය කිරීමට නොහැකි වීම හේතුවෙන් අවසාන තොගයේ වටිනාකම ලෙස ශේෂ පත්‍රය තුළ නිරූපණය කර ඇති රු.278,323,718 ක රසායනික පොහොර තොග අගයෙහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | එකම පොහොර වර්ග වුවත් භාවිත කරන බෝග අනුව ඒවාහි ශුද්ධ උපලබ්ධිත අගයන් වෙනස් වේ. පොහොර ලේකම් කාර්යාලය විසින් නිකුත් කෙරූ චක්‍රලේඛයට අනුව අනෙකුත් බෝග 50Kg බෑගයක රු.1,000/- ද වී පොහොර සඳහා 50Kg බෑගයක් රු.500/- මිලකටද අප විසින් අළෙවි කළ යුතු වේ. ඒ අනුව, කුඹුරු සඳහා යොදා ගන්නා පොහොරවල ශුද්ධ උපලබ්ධිත අගයත් අනෙකුත් බෝග සඳහා භාවිතයට ගැනෙන එම රසායනික පොහොර වර්ගයේම ශුද්ධ උපලබ්ධිත අගයත් වෙනස් වේ. මහා භාණ්ඩාගාරයෙන් අප ආයතනයට සහනාධාර මුදල් ලබා දෙනුයේද එම වෙනස පදනම්කර ගෙනය. ඒ අනුව ගිණුම් ප්‍රමිත අංක 02 ට අනුකූලව අප විසින් තොග අයිතම 02 ක් සේ සලකා තොග වටිනාකම අගයකොට ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් සෘජුව මිලදී ගන්නා පොහොර වර්ග සමාගම තුළදී අලෙවි කිරීම, මිශ්‍ර කිරීම, කුඩා පැකට් ලෙස සැකසීම, නැවත මළු කිරීම, එක් එක් වර්ගයන් අතර මාරු කිරීම ආදී විවිධ ක්‍රියාවලියන්ට භාජනය වේ. ගිණුම් වර්ෂය තුළ මිලදීගත් සෘජු පොහොර සම්බන්ධයෙන් උක්ත විවිධ ක්‍රියාවලීන්ට ලක් කළ බවට සංඛ්‍යා ඇතුළත් කර අවසන් තොගය | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. වැඩිදුර කරුණු අධ්‍යයනයකර එළඹෙන විගණනය වෙත නිසි ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කරමි. | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී තොග ඌනතාවයන් ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගණනය කර ඇතත්, තොග ගණනයේදී හඳුනාගෙන ඇති පොහොර මෙට්‍රික් ටොන් **41.891** ක තොග ඌනතාවය රු.මිලියන **1,182** ක් වූ විකුණුම් පිරිවැයට ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වසරේ ලාභය ආසන්න වශයෙන් එම ඌනතාවයේ සාමාන්‍ය පිරිවැය වන රු.**2,094,550** කින් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | නීත්‍යානුකූලව පවරා නොගත් සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉඩම රු.**90,000,000** කට අගයකොට ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | සමාගම වර්ෂ **1997**දී නැවතත් රජයට පවරා ගත් අවස්ථාවේදී ආයතනයේ ආරම්භක ශේෂ පත්‍රය සැකසීමට මහා භාණ්ඩාගාර නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී. එහිදී එම කමිටුව විසින් වත්කම් වගකීම් තීරණය කිරීමේදී සමාගම පිහිටි ඉඩම රු.**90,000,000/-** කට අගයකොට ශේෂ පත්‍රයට ඇතුළත්කර ඇත. මෙම ඉඩම පෙරදී සමාගම සතු වුවත් නැවත රජයට පවරා ගන්නා අවස්ථාවේදී එහි අයිතිය කැළණිය ප්‍රාදේශීය සභාවටත් ඉන් පසුව නාගරික සංවර්ධන අධිකාරියටත් පවරා ඇත. ඉඩමෙහි අයිතිය සමාගමට ලබා දීමට කැබිනට් අනුමැතියද මේ වන විට හිමි වී ඇත. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාගම වෙත පවරා ගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

**1.5.3** අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාගමේ සේවකයන් විසින් ඉතිරිකරගත් කෙටි හා වෛද්‍ය නිවාඩු සඳහා එකතු වටිනාකම රු.**4,926,394** ක නිවාඩු දීමනා හා සමාගමේ විධායක නිලධාරීන් සඳහා එකතු වටිනාකම රු.**847,427** ක විධායක දීමනා ගෙවීම්කර තිබුණි. | පැමිණීමේ දිරිදීමනාවක් ලෙස සමාගමෙහි අරමුදල් භාවිතා කොට සමාගමෙහි ස්ථිර සේවක මහත්ම, මහත්මීන් වෙත දීර්ඝ කාලයක් පුරාවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ලබා නොගත් වෛද්‍ය නිවාඩු වෙනුවෙන් ගෙවීම් කර තිබෙන බව සඳහන් කරනු කැමැත්තෙමි. | මෙම ගෙවීම් නීත්‍යානුකූල නොවූ දීමනා සේ සලකා ක්‍රියා කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ පොහොර සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කළ යුතු දිනට මහාභාණ්ඩාගරයෙන් අක්මුදල් නොලැබීම හේතුවෙන් බැංකුව මගින් ලබාගත් කෙටිකාලීන ණය මුදලක් මගින් ගෙවීම් නිරවුල් කර තිබුණි. පසුව කෙටිකාලීන ණය මුදල මහාභාණ්ඩාගාරයේ වගකීමට යටත් දීර්ඝකාලීන ණයකට පරිවර්තනයකොට තිබූ නමුත් කෙටිකාලීන ණය සඳහා බැංකුවලට ගෙවන ලද ණය පොලී අයකර ගැනීම සම්බන්ධයෙන් මහාභාණ්ඩාගාරය සමග එකඟතාවයට පත් නොවීම හා කෙටිකාලීන පොලිය දීර්ඝකාලීන ණය මුදලට ඇතුළත්කර නොතිබීම හේතුවෙන් භාණ්ඩාගාරයේ වගකීම තහවුරු නොකළ රු.158,498,393 ක කෙටිකාලීන ණය පොලී මහාභාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම කරුණු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය හා දිගින් දිගටම වාචිකව සහ ලිඛිතව කරුණු සාකච්ඡා කරමින් පවතින අතර, මෙම මුදල ලබාගැනීමට කටයුතු කරමි. | මහා භාණ්ඩාගාරයෙන් වගකීම තහවුරුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජංගම වත්කමක් ලෙස පෙර වර්ෂයේ සිට පැවත එන ලංකා පොහොර සමාගමෙන් ලැබියයුතු රු.4,993,147 ක වෙළඳ ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ලංකා පොහොර සමාගමෙන් ලැබිය යුතු වෙළඳ ණයගැති ශේෂය 2007 වර්ෂයේ සිට පවතින ශේෂයක් වන අතර, මේ පිළිබඳව අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුව මඟින්ද සාකච්ඡාවට බඳුන් වී ඉහත ශේෂය අප සමාගම වෙත ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා තිබෙන බව සඳහන් කරනු කැමැත්තෙමි. මේ පිළිබඳව ලංකා පොහොර සමාගම වෙත අවස්ථා ගණනාවකදී දැනුවත්කොට තිබුණද ගෙවීමට කටයුතුකර නොමැති බැවින් ඉදිරියේදී මේ පිළිබඳව අමාත්‍යාංශයද සම්බන්ධකර ගනිමින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වෙමි. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) **2014/ 2015** වර්ෂයේ සිට ජංගම වත්කමක් ලෙස පැවත එන **රු.5,047,893** ක විවිධ ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | මෙම ශේෂයද **2006** වර්ෂයේ සිට පවතින ශේෂයක් වන අතර, සහනාධාර පොහොර වැඩසටහන ආරම්භයේදී ඇති වූ හිඟ ශේෂයක් වේ. එම ශේෂයන් පිළිබඳව අදාළ පාර්ශවයන් වෙත අවස්ථා ගණනවකදී දැනුම්දීම් සිදුකර තිබුණද ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් දක්වා නොමැති බැවින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වන අතර දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබෙන ගනුදෙනුකරුවන්ද මෙම ශේෂය තුළ නිරූපණය වේ. | විවිධ ණයගැති ශේෂ නිවැරදිව හඳුනාගෙන අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පෙර වර්ෂවලදී උපචිත වියදම් ලෙස ගිණුම්ගත කරන ලද එකතු වටිනාකම **රු.3,600,816**ක වියදම් සමාලෝචිත වර්ෂය අවසාන දිනවනවිටත් නිරවුල්කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වන අතර, **රු.728,003.19** ක සඳහා ජර්නල් අංක **J/MAR/AQ-**අනු **(07)** මඟින් නිවැරදිකොට මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කරන ලදී. නමුත් පහත ආයතන සඳහා ඉදිරියේදී ගෙවීම් කිරීමට ඇති බව සඳහන් කරමි.<br><br>**Link Interiors Pvt Ltd** රු. **338,989.28**<br>**Science Land Information Technology** රු. **275,000.00**<br>**Architrend Consultant** රු. **2,258,823.53** | උපචිත වියදම් නිවැරදිව ගිණුම්ගතකර අදාළ කාලපරිච්ඡේදය තුළ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීතිරීති / විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2009** අංක **09** දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | ජාතිය ගොඩනැඟීමේ බද්ද නියමිත පරිදි ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් **2016** අවසන් කාර්තුව හා | ප්‍රාදේශීය ගබඩාවල අළෙවි තත්වය පිළිබඳ ලේඛන ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමේදී සිදු වූ ප්‍රමාදන් හේතුවෙන් ඒ සඳහා බදු ගෙවීම් ප්‍රමාද වීම් නිසා මෙම දණ්ඩනය ගෙවීමට සිදු ව ඇත. මෙම දුර්වලතාවය මග හැරවීම | අදාළ පනතට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | **2017 මුල් කාර්තු 02 සඳහා දේශීය ආදායම් බදු තක්සේරුවකට අනුව රු.675,558 ක් දඩ වශයෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණි.** | **සඳහා ප්‍රාදේශීය ගබඩා වෙතින් ලේඛන මසකට දෙවරක් ලබා ගැනීම සඳහා බෙදා හැරීමේ සේවාවක සහයෝගය (Courier service) ලබා ගෙන ඇති අතර, මේ වන විට නිසි ලෙස එම තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත ලැබේ. එබැවින් ඉදිරියේ දී මෙම ගැටලුව ඇති නොවීමට අවශ්‍ය ක්‍රමවේදයන් දැනටමත් ගෙන ඇති බව දන්වා සිටිනු කැමැත්තෙමි.** | |
| **(ආ)** | **2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 06 පරිච්ඡේදය 5.1 වගන්තිය** | **ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය වර්ෂය අවසන් වී දින 200 ක් ගත වීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.** | **2020 මාර්තු මාසයේ ආරම්භ වූ කොවිඩ් වසංගත තත්වය නිසාවෙන් රට තුළ උද්ගත වූ හදිසි තත්වය සමඟ අඛණ්ඩව මාස 03 ක පමණ කාලයක් නිරෝධායන ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම හා සෞඛ්‍ය නිර්දේශවලට අනුව ආයතනයෙහි කාර්යමණ්ඩලය අවම සංඛ්‍යාවක් යටතේ පවත්වාගෙන යෑමට සිදු වීම හේතුවෙන් මෙම ගැටලුව උද්ගත වූ බව සඳහන් කරනු කැමැත්තෙමි.** | **චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.** |
| **(ඇ)** | **2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3.3 ඡේදය** | **මහාභාණ්ඩාගාර යෙන් අනුමත කර ගන්නා ලද දිරි දීමනා ක්‍රමයකින් තොරව හා ජාතික වැටුප් හා දීමනා ප්‍රතිපත්තීන්ට අනුව විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු.15,806,604 ක් දිරි දීමනා ලෙස සේවකයන් වෙත ගෙවීම් කර තිබුණි.** | **අප සමාගම දීර්ඝ කාලයක් පුරා සමාගමේ ස්ථිර සේවක සේවිකාවන් වෙත දිරි දීමනා ගෙවීම සිදු කර ගෙන යනු ලබන අතර, අදාළ මූල්‍ය වර්ෂය තුලද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව දිරි දීමනා ගෙවීම සිදු කරනු ලැබ ඇති අතර, මේ වන විට මෙම දිරිදීමනා ගෙවීම් සඳහා මහාභාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන ඇති බව දන්වා සිටිනු කැමැත්තෙමි.** | **මෙම ගෙවීම් නීත්‍යානුකූල නොවූ දීමනා සේ සලකා ක්‍රියා කළ යුතුය.** |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **2015 මැයි 25 දිනැති අංක PED /1/2015 චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 25 දිනැති අංක PED 1/2015 (i)** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3 වගන්තිය | චක්‍රලේඛය තුළින් ආවරණය නොවන මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 05 දෙනෙකු වෙත චක්‍රලේඛ විධිවිධාන අතික්‍රමණය කරමින් එක් නිලධාරියකු වෙත රු.10,000 බැගින් වන සේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත රු.600,000 ක ප්‍රවාහන දීමනා ලබාදී තිබුණි. | **2015.05.25 දිනැති අංක PED 1/2015** චක්‍රලේඛණයෙහි 04 ඡේදයෙහි සඳහන් පරිදි මධ්‍යම මට්ටමේ කලමනාකරුවන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කිරීමට ප්‍රායෝගිකව ගැටලු පැවතීම හා ඒ සඳහා යන පිරිවැය අධික වීම හේතුවෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය මත ලංකා පොහොර සමාගම අනුගමනය කරන ක්‍රමවේදයම සලකා මෙම දීමනාව ලබා දෙන බව දන්වනු කැමැත්තෙමි. | මෙම දීමනා නීත්‍යානුකූල නොවූ වියදම් සේ සලකා ක්‍රියා කළ යුතුය. |

**1.8** මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් වර්ෂය තුළ කාරක ප්‍රාග්ධනය මැනවින් කළමනාකරණය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රු.78,269,924 ක් දක්වා බැංකු අයිරාවන් භාවිතයට ගැනීමට සිදුවීම හේතුවෙන් රු.2,109,634ක වලක්වාගත හැකිව තිබූ අයිරා පොලී වියදමක් දැරීමට සිදු වී තිබුණි. | සහනාධාර පොහොර වැඩසටහන් ක්‍රමවේදය වෙනස් වීමත් සමඟ ගොවියාට පොහොර නොමිලේ ලබා දීම සිදු කිරීමේදී අප සමාගම ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පොහොර නිකුත් කරනුයේ ණය පදනම මත වේ. ඒ සඳහා මුදල් ගෙවීම් ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තුමේන්තුව මඟින් සිදු කරනු ලබන අතර, ඒ සඳහා කාලයක් ගත වේ. එහෙත් නියමිත දිනයන්හිදී ආනයනය කරනු ලබන පොහොර තොග නිශ්කාෂණය කර ගත යුතු වනවා සේම, එම පොහොර තොග නිසි වේලාවට ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත බෙදාහැරීම සිදු කළ යුතු වේ. ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වේ.<br>එහෙත් නිසි වෙලාවට මහා භාණ්ඩාගාරයෙන් හා ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තුමේන්තුවෙන් මුදල් නොලැබීම හේතුවෙන් මෙම ගැටලුව මතු වේ. මෙම ගැටලුව අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අවධානයට යොමුකර අධ්‍යක්ෂ මණ්ඩලයෙහිද තීරණය පරිදි නිසි වේලාවට පොහොර තොග නිශ්කාෂණය කර ගැනීම හා නිසි කලට පොහොර තොග බෙදා හැරීම සිදු කිරීම සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අප සමාගම සතු ස්ථාවර තැන්පතු ඇපයට තබා මෙම බැංකු අයිරා පහසුකම් ලබා ගෙන තිබෙන අතර, ඒ හේතුවෙන් අප | ණය පොලී වියදම් අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සමාගමට දැරීමට සිදු වන පොලී වියදම අවම කර ගැනීමට හැකිවී තිබෙන බව දන්වා සිටිනු කැමැත්තෙමි.<br>එසේ නොවන්නේ නම් ඉහත සඳහන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට බැංකු ණය පහසුකමක් ලබා ගැනීමට සිදු වන අතර, ඒ සඳහා වැඩි පොලී ප්‍රතිශතයක් ද දැරීමට සිදු වේ.එසේම බැංකු අයිරාව සඳහා පොලී අය කරනුයේ අප විසින් භාවිත කළ අයිරා පහසුකමෙහි වටිනාකම සඳහා පමණක් වන අතර, එහි පොලී ප්‍රතිශතය ස්ථාවර තැන්පතු පොලී ප්‍රතිශතයට වඩා 2%ක ප්‍රතිශතයක් පමණි. එනම් 12.75%ක ප්‍රතිශතයක් වන අතර, ස්ථාවර තැන්පතු පොලී ප්‍රතිශතය 10.75% වේ. තවද මෙම මොහොතේ බැංකු ණය පහසුකමක් ලබා ගන්නේ නම්, ඒ සඳහා 14.5%ක පමණ පොලී ප්‍රතිශතයක් දැරීමට සිදු වන බව දන්වා සිටිනු කැමැත්තෙමි. එසේ නැතහොත් අප සමාගම සතු ස්ථාවර තැන්පතු කල් පිරීමට පෙර නිශ්කාෂණය කළ යුතු වේ. එහිදී ද කල් පිරීමට පෙර නිශ්කාෂණය කිරීම හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදු වේ. එනම්, 10.75%ක පොලී ප්‍රතිශතයකට ආරම්භ කොට ඇති ස්ථාවර තැන්පතුව කල් පිරීමට පෙර නිශ්කාෂණය කරන්නේ නම් 5%ක පමණ පොලී ප්‍රතිශතයෙහි අඩු වීමක් සිදු වන බවද සඳහන් කරනු කැමැත්තෙමි.<br>ඉහත සඳහන් තත්වයන් හා සලකා බලන විට වඩාත් සුදුසුම ක්‍රියාමාර්ගය ලෙස ස්ථාවර තැන්පතු ඇපයට තබා අයිරා පහසුකමක් ලබාගෙන කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගැනීම තුලින් වඩාත් අවම පොලී පිරිවැයකින් අදාළ කටයුත්ත සිදු කර ගත හැකි බව අපගේ අදහසයි. | |
| (ආ) | සැපයුම්කරුවන් විසින් ඇනවුමට වඩා රු.6,642,835 ක් අඩුවෙන් පොහොර සපයා තිබුණු අතර එම ප්‍රමාණය සැපයුම්කරුගෙන් නැවත අයකරගත යුතු ලෙස ගිණුම්ගතකර කෙටිකාලීන බැංකු ණය මගින් ගෙවීම් කිරීමටත්, එම ණය වෙනුවෙන්ද අතිරේක පොලී වියදමක් දැරීමටත් සිදු වී තිබුණි. | පොහොර ආනයනය කිරීමේදී 5%ක ඌන හෝ අතිරික්ත ප්‍රමාණාත්මක විචලනයක් ඇති වීමේ සම්භාවිතාව සැළකිල්ලට ගනිමින් ගිවිසුම් වලට එළඹෙනු ලබයි. ඒ අනුව ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිස් පතෙහි වටිනාකම හා ප්‍රමාණය පදනම් කොට ගෙන ණයවර ලිපි විවෘත කරනු ලබයි. තවද අදාළ ඇණවුම් වරායෙන් නිශ්කාෂණය කර ගත් පසු ණයවර ලිපි වටිනාකම නැවත සංශෝධනය කිරීමේ හැකියාවක් නොමැති බව අවධාරණය කරන අතර, ඉදිරියේදී මේ පිළිබඳව විධිමත්ව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා සිටිමි. | ලැබුණු පොහොර ප්‍රමාණය පමණක් ගිණුම්ගත කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

**සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.162,858,311 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.147,640,231 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,218,080 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම් බදු වියදම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බෙදාහැරීමේ පිරිවැය අඩු කළ හැකි බෙදාහැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමකින් හා ගබඩා අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ගබඩා 13 ක් පවත්වාගෙනයාම තුළින් වළක්වාගත හැකි පරිපාලන මෙහෙයුම් හා ප්‍රවාහන වියදම් වළක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රජයේ පොහොර සහනාධාර වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ගබඩාවන් භාවිතා කරනු ලබන අතර, නිසි වේලාවට හා හිඟයක් ඇති නොවන පරිදි පොහොර බෙදාහැරීමේ කටයුතු සිදු කර ගැනීම සඳහා මෙම ගබඩාවන් ඉවහල් වී තිබේ. විශේෂයෙන් යල හා මහ යන කන්න ආරම්භයත් සමඟ ඉතා සීමිත කාලයක් තුළ ඇති වන්නා වූ විශාල ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ දී ඇති වන්නා දුෂ්කරතාවයන් මග හරවා ගැනීම පිණිස මෙම ප්‍රාදේශිය ගබඩා ප්‍රයෝජනවත් වන බව අපගේ හැඟීමයි. එසේම අප සමාගම වෙත පොහොර බෙදාහැරීමේ කටයුතු පැවරී ඇති ගොවිජනසේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව මෙම ගබඩා සියල්ල පිහිටා තිබෙන බවද සඳහන් කරනු කැමැත්තෙමි. | කාර්යක්ෂම හා ඵලදායී බෙදාහැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගිණුම් වර්ෂය තුළ ආනයනය කරන ලද ණයවර ලිපි 06 කට අදාළ TSP මෙ.ටො 3,575 ක් (රසායනාගාර වාර්තා අසමත් වීම හේතුවෙන්) ගොවි ජනතාව වෙත නිකුත් කිරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි අනුමැතිය ලැබී නොතිබුණි. කෙසේ නමුත් රසායනාගාර වාර්තා නිකුත්වීමට පෙර අනුමැතියකින් තොරව සමාගම විසින් උක්ත පොහොර තොග ගොවි ජනතාව වෙත බෙදාහැර තිබුණි. කොළඹ කොමර්ෂල් පොහොර | මෙම පොහොර තොගය මහ කන්නයේ දී බෙදා හැරීම අරමුණු කර ගනිමින් ආනයනය කරන ලද අතර, පොහොර තොග නිශ්කාෂණය කර ගත් වහාම අළෙවි බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන ලදී. එහෙත් අළෙවි බලපත්‍රය ලැබීම දිගින් දිගටම ප්‍රමාද වීම නිසාවෙන් අදාළ පොහොර තොගය නිකුත් කිරීම ප්‍රමාද විය. ඒ හේතුවෙන් රට තුළ උග්‍ර පොහොර හිඟයක් ඇති විය. මේ නිසාවෙන් ගොවි උද්ඝෝෂණ හට ගැනීම වළක්වාලීමටත් ඒ හේතුවෙන් රජය දැඩි අපහසුතාවයකට ලක් වීම නවත්වාලීමේ අරමුණින් අදාළ පොහොර තොග පැටවීමේ දී ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාරයක් මඟින් නිකුත් කළ තත්ව සහතිකය හා එම තත්ව සහතිකය පදනම් කර ගනිමින් මෙම පොහොර තොගය කොළඹ වරාය වෙත ගෙන ඒමට ජාතික පොහොර ලේකම් කාර්යාලය | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය නොමැති පොහොර ගොවීන් අතරේ බෙදා නොහැරිය යුතුය. |

| | | |
|---|---|---|
| සමාගම විසින් ගොවීන් වෙත බෙදාහරින ලද උක්ත අසමත් පොහොර තොග සඳහා පොහොර සහනාධාර මුදල් ගෙවීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය නිර්දේශකර නොතිබූ නමුත් පොහොර සඳහා ගෙවියයුතු දිනට කෙටිකාලීන බැංකු ණයක් මගින් ගෙවීම් පියවා පසුව මහාභාණ්ඩාගාරයේ වගකීම සහිතව දිගු කාලීන ණය මුදලකට පරිවර්තනයකොට විධිමත් අනුමැතියකින් තොරව සහනාධාර මුදල් ලබාගැනීමට සමාගම කටයුතු කර තිබුණි. | විසින් ලබා දුන් පූර්ව අනුමැතිය පදනම් කර ගනිමින් ජාතික පොහොර ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කොට මෙම පොහොර තොගය බෙදා හැරීමට කටයුතු කළ බව දන්වා සිටීනු කැමැත්තෙමි. | |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහනාධාර පොහොර තොග නිසි කළමනාරණයෙන් යුක්තව බෙදාහැරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාගම තුළදී හානියට පත් පොහොර මෙ.ටො 369 ක් සමාලෝචිත ගිණුම් වර්ෂය තුළ නොමිලේ බෙදාහැරීමට කටයුතු කර තිබීම හේතුවෙන් සමාගමට සිදු වී ඇති අලාභය රු.22,140,000 ක් විය. | සමාලෝචිත ගිණුම් වර්ෂය තුළ හානියට පත් පොහොර මෙ.ටො.369 ක් නොමිලේ බෙදාහැරීම සිදු කරන ලදී. මෙසේ නොමිලේ බෙදා හැරීම සිදු කරනු ලැබුයේ රාජ්‍ය ආයතන සඳහා පමණක් වන අතර, ඒ සඳහා 2019.05.21 දිනැති අමාත්‍යංශ ලේකම්වරයාගේ උපදෙස් හා 2019.05.30 පැවති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී තිබේ. එසේම මෙම පොහොර තොගය තොග හානි නිසා එකතු වූ තොගයක් නොවන අතර, මෙහිදී ආයතනයට හෝ රජයට කිසිඳු අලාභයක් සිදු වී නොමැති බව අවධාරණය කරනු කැමැත්තෙමි.<br>තවද මෙවැනි පොහොර තොගයක් ආයතනය තුල එකතු වීම සිදු වී ඇත්තේ පහත හේතූන් නිසා බව දන්වා සිටිනු කැමැත්තෙමි.<br><br>•ආනයනික තොග හානියට පත්ව තිබීම.<br>පැටවුම් වරායේ සිට කොළඹ වරාය දක්වා නෞකාව යාත්‍රා කිරීමේ දී විවිධ හේතූන් මත (යාන්ත්‍රික, දේශගුණික ආදි) පොහොර තෙත් බවට පත් වීම, අධික කැට බවට පත්වීම, පොහොර | රජයේ සහනාධාර පොහොර තොග නිසි කලමනාකරණයෙන් යුක්තව බෙදාහැරීමට කටයුතු කළ යුතුය. |

දුර්වර්ණ වීම ආදි හේතු මත තොග හානියට පත්වීම. එහිදී සිදුවන මූල්‍යමය අලාභය සැපයුම්කරුගෙන් අයකර ගනු ලබන අතර, හානි වී ඇති තොගය ඇමදුම් පොහොර (Sweeping) ලෙස තොග පොත්වලට ගනු ලැබේ.

•ආනයනික පොහොර ගොඩ බෑමේ දී එනම්, මළු ගත නොකළ පොහොර (bulk) නෞකාවේ සිට මළු ගත කරනු ලබන යන්ත්‍ර වලට හෝ මළු ගත කර ඇති පොහොර ලොරි රථ වලට ගොඩ බෑමේ දී නැව් තට්ටුව මත විසිරෙන පොහොර අතු ගා එකතු කර, සලකුණු රහිත මළු වලට පුරවා ගබඩාවට සපයනු ලබන අතර, ඒවාද ඇමදුම් පොහොර ලෙස තොගයට එකතු කරනු ලැබේ.

•වරායේ සිට මධ්‍යම ගබඩාවට ලොරි රථ මඟින් පොහොර ප්‍රවාහනය කර පිටව යන ලොරි රථ වල තට්ටුව මත විසිරී ඇති පොහොර අතු ගා එකතු කරනු ලබන අතර, ඒවා මළු ගත කර බර කිරීමෙන් අනතුරුව ඇමදුම් පොහොර තොගයට එකතු කරනු ලැබේ.

•මධ්‍යම ගබඩාවන්හි සහ ප්‍රාදේශීය ගබඩාවන්හි පොහොර මළු බෑවීමේ දී හා පැටවීමේ දී කොකු භාවිතය හේතුවෙන් බිම පතිත වන පොහොර වලින් නැවත භාවිතයට ගත නොහැකි තත්වයට පත් වන යම් පොහොර ප්‍රමාණයක් ඇමදුම් පොහොර ලෙස තොගයට එකතු වේ. මෙහිදී තොග හානි තත්වයක් සිදු නොවනුයේ බොහෝ විට මල්ලක තිබිය යුතු ශුද්ධ බර ප්‍රමාණයට වඩා වැඩි බරකින් යුත් පොහොර ප්‍රමාණයක් මළු වල පැවතීමයි.

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හම්බන්තොට බදු ඉඩමේ ගබඩාවක් ඉදිකිරීම සඳහා උපදේශන ගාස්තු ඇතුළු ප්‍රාරම්භක වියදම් ලෙස පසුගිය වර්ෂවල රු.3,534,711 හා සමාලෝචිත වර්ෂයේදී රු.198,190 ක් ලෙස එකතු වටිනාකම රු.3,732,901 ක් ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ **(Capital Work In Progress)** ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් අදාළ ඉඩමේ ගබඩාවක් ඉදිකර නොතිබීම හේතුවෙන් උක්ත වියදම් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | හම්බන්තොට වරාය භාවිතයට ගනිමින් රසායනික පොහොර ගෙන්වීමේ සැලැස්මකට අනුව මෙම ඉඩමෙහි ගබඩා සංකීර්ණයක් නිර්මාණය කිරීමට යෝජනා වී තිබුණද හම්බන්තොටින් පොහොර ආනයනයේදී මතු වන ප්‍රායෝගික ගැටලු නිරාකරණයකර ගන්නා තෙක් තාවකාලිකව මෙම ව්‍යාපෘතිය නතර වී තිබෙන අතර, ඉදිරියේදී රජයෙහි ප්‍රතිපත්තිමය තීරණ අනුව දැනට සැලසුම්කොට ඇති ව්‍යාපෘතිය එම ප්‍රතිපත්තිමය තීරණවලට ගැළපෙන පරිදි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර, එබැවින් දැනට මේ සඳහා දරා ඇති පිරිවැය එම ව්‍යාපෘතිය සඳහාද අදාළ කර ගැනිමට අදහස් කරන බව දන්වා සිටිනු කැමැත්තෙමි. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යායනයක් කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අලෙවි කලමනාකරණ තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරියෙකු පත් කිරීමට කටයුතු නොකර 2016 අප්‍රේල් 04 දින සිට (සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වාම) එම තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත් කර තිබුණි. | 2016 සිට අළෙවි කළමනාකරණ තනතුර පුරප්පාඩු වී තිබුණද එම තනතුරෙහි සේවය කල නිළධාරියාගේ සේවය අත්හිටුවා අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරමින් පැවතිම හේතුවෙන් එම තනතුරට නිළධාරියකු බඳවා ගැනීමට නොහැකි වී තිබූ අතර, මෙම ගැටලුව විසඳීමෙන් පසු අවස්ථා ගණනාවක දී නව අළෙවි කළමනාකරුවකු බඳවා ගැනීමට ප්‍රසිද්ධ දැන්වීම් පළ කොට සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණද එම තනතුර සඳහා සුදුසුකම් සපුරන ලද නිළධාරියකු ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉහත පුරප්පාඩුව පිරවීමට නොහැකි වී තිබිණි. එහෙත් නැවතත් අයදුම් පත් කැඳවා නව කළමනාකරුවකු බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවද දන්වා සිටිනු කැමැත්තෙමි. | අනුමත තනතුරුවල පුරප්පාඩු පිරිවීමට කටයුතු කළ යුතුය. |